# සමාජ සේවා පුවත්


2013-03-23




## දැයට කිරුළ විශේෂ කලාපය — 2013







## ආබාධිත බව පිළිබඳ ජාත්‍යන්තර වාර්තාව එළිදැක්වීම

ආබාධිත බව පිළිබඳ ජාත්‍යන්තර වාර්තාව එළිදැක්වීම 2012 මැයි මස 30 වන දින සමාජ සේවා අමාත්‍ය ගරු ෆීලික්ස් පෙරේරා මැතිතුමා, සමාජ සේවා නියෝජ්‍ය අමාත්‍ය ගරු චන්ද්‍රසිරි සූරියආරච්චි මැතිතුමා, සෞඛ්‍ය නියෝජ්‍ය අමාත්‍ය ගරු ලලිත් දිසානායක මැතිතුමා ආදී මැති ඇමතිවරුන්ගේ ප්‍රධානත්වයෙන් කොළඹ කලාභවනේ දී පැවැත්විණ. මෙම වැදගත් අවස්ථාව සඳහා ලෝක සෞඛ්‍ය සංවිධානයේ තාක්ෂණික නිලධාරී ආචාර්ය ටොම් ශේක්ෂ්පියර් මහතා සහභාගී වූ අතර ආබාධිත බව පිළිබඳ ජාත්‍යන්තර වාර්තාව සම්බන්ධයෙන් දේශනයක් ද ඉදිරිපත් කරන ලදී. සමාජ සේවා අමාත්‍යාංශයේ මෙන්ම විවිධ අමාත්‍යාංශයන්හි ජ්‍යෙෂ්ඨ නිලධාරීන්, දානපති ආයතනයන්හි සහ රාජ්‍ය නොවන සංවිධානයන්හි නියෝජිතවරුන් ද මීට සහභාගී වූහ.

අනතුරුව ආබාධිත බව පිළිබඳ ජාතික ක්‍රියාකාරී සැලැස්මක් කෙටුම්පත් කිරීම සඳහා වැඩමුළුවක් ලෝක සෞඛ්‍ය සංවිධානය, සමාජ සේවා අමාත්‍යාංශය හා තෝරා ගත් රාජ්‍ය නොවන සංවිධානයන්හි සම්පත් දායකයන්ගේ සහභාගීත්වයෙන් ගලදාරී හෝටලයේ දී පැවැත්විය. මෙම වැඩමුළුවේදී ප්‍රධාන සම්පත්දායක වශයෙන් ආචාර්ය ටොම් ශේක්ෂ්පියර් මහතා සහභාගී වූ අතර ලෝක සෞඛ්‍ය සංවිධානයේ නේවාසික නියෝජිත ආචාර්ය එෆ්. ආර්. මෙහෙතා මහතා ද සහභාගී විය.



### ඇතුල් පිටු


| | |
|---|---|
| වැඩසටහන් | 2 |
| සේවාවන් | 3 |
| සැමරුම් | 4 |
| වෘත්තීය මෙවලම් | 5 |
| ජංගම සේවා හා නිවාස ව්‍යාපෘති | 6 |
| උපාධි හා ඩිප්ලෝමා | 7 |
| දැයට කිරුළේ වැඩසටහන් | 8 |


### විශේෂතා

* නිවාස ආධාර හා ප්‍රවේශ පහසුකම්
* වෛද්‍ය ආධාර හා අධ්‍යාපන ආධාර
* රු.3000/- මාසික දීමනා
* ස්වයංරැකියා ආධාර
* ආධාරක උපකරණ
* රු.1000/- වැඩිහිටි දීමනා
* වෘත්තීය පුහුණු
* උපදේශන සේවා
* සමාජ සත්කාරක ව්‍යාපෘති
* උපාධි හා ඩිප්ලෝමා පාඨමාලා

# උපදේශන සහ මනෝසමාජ මැදිහත්වීමේ වැඩසටහන

උපදේශන සහ මනෝසමාජ මැදිහත්වීමේ වැඩසටහනක් 2012 ජූලි 8, 9 සහ 10 දිනයන් දී බකමූණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ඇලහැර ප්‍රදේශයේ දමනයාය, නුවරගල යන ගම්මානයන්හි පැවැත්විණ. මේ සඳහා ජාතික උපදේශන මධ්‍යස්ථානයේ උපදේශකයන් දස දෙනෙක් සහභාගී වූ අතර ප්‍රදේශයේ සෑම පවුලක්ම සම්මුඛ පරීක්ෂණයට ලක් කිරීම තුළින් ඔවුන්ගේ මනෝ සමාජයීය ගැටළු හඳුනා ගැනීමට උත්සාහ



කෙරිණ. මෙම වැඩසටහනට බකමූණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙහි සේවය කරනු ලබන රාජ්‍ය සේවකයන් 40 දෙනෙකු පමණ සහභාගී වූ අතර ප්‍රාදේශවාසීන් අතර හඳුනා ගත් මනෝ සමාජයීය ගැටළුද ඔවුන් මගින් ඉදිරිපත් කෙරිණ. මෙම ගම්මාන නගාසිටුවීමෙහිලා ක්‍රියාකාරී සැලැස්මක් දියත් කිරීමෙහි අවශ්‍යතාවය පැහැදිලි කරමින් අමාත්‍යාංශයේ උපදේශක නිලධාරීන් විසින් යෝජිත ක්‍රියාකාරී සැලැස්ම ඉදිරිපත් කරන ලදී.

# සිසුනැණ පුබුදුව වැඩසටහන

2013 වර්ෂයේ දැයට කිරුළ සංවර්ධන වැඩසටහන සමාරම්භය සනිටුහන් කරමින් සමාජ සේවා අමාත්‍යාංශය, ළමුන් පුරුද්දක් ලෙස කියවීමට හුරුකිරීම සඳහා ක්‍රියාත්මක කරනු ලබන සිසුනැණ පුබුදුව වැඩසටහන අම්පාර දිස්ත්‍රික්කයේ දමන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කොක්නහර ග්‍රාමයේ ආරම්භ කරනු ලැබූ අතර මෙහිදී රු.50,000/- වටිනා පොත් කට්ටලයක්, වානේ අල්මාරියක්, ලබා දී වැඩසටහන පවත්වා ගෙන යාම සඳහා ස්වෙච්ඡා නායකයන් 21 දෙනෙකු පුහුණු කිරීමට කටයුතු කර ඇත.



## உட்பிரவேசிப்பு தொடர்பான வேலையரங்கு - வவுனியா மற்றும் யாழ்ப்பாண மாவட்டம்.

உட்பிரவேசிப்பு தொடர்பான வேலையரங்கு, 2012 ஆகஸ்டு 30 ஆந் திகதி வவுனியா மாவட்டத்திலும் மற்றும் 2012 ஒக்டோபர் 22 ஆந்திகதி யாழ் மாவட்டச் செயலகத்திலும் நடாத்தப்பட்டது. மாவட்டத்தில் நிர்மாணச் செயற்பாடுகளுடன் தொடர்புபட்ட பொறியியலாளர்கள், தொழில்நுட்ப உத்தியோகத்தர்கள் மற்றும் பட வரைஞர்கள் இவ் வேலையரங்கில் பங்குபற்றினர்.

மேலும் வவுனியா மாவட்டத்தில் நடாத்தப்பட்ட வேலையரங்கில் சமூக சேவைகள் அமைச்சின் செயலாளர் திருமதி. இமெல்டா சுகுமார் அவர்கள் சிறப்பு விருந்தினராகக் கலந்து கொண்டிருந்தமை சிறப்பம்சமாகும். அங்கவீனர்களுக்குச் சிநேகபூர்வமான சூழலொன்றை வட மாகாணத்தின் பிரதான நகரங்களில் உருவாக்குவதற்கு சமூக சேவைகள் கௌரவ அமைச்சர் மற்றும் கௌரவ பிரதியமைச்சர் மிகவும் ஆர்வமாக உள்ளனர் என அவர் தனது உரையில் குறிப்பிட்டிருந்தார். இந்நிகழ்வில் கலந்துகொண்ட யாழ் மாவட்ட மேலதிக செயலாளரான திருமதி. ரூபினி வரதலிங்கம் அவர்கள் இவ்வேலையரங்கினை ஒழுங்கு செய்ததற்காக கௌரவ அமைச்சர் மற்றும் செயலாளருக்கு விசேடமாக நன்றியினைக் கூறினார்.

இவ்விரு வேலையரங்குகளிலும் கலந்து கொண்ட அங்கவீனமுற்ற நபர்களுக்கான தேசிய செயலகத்தின் பணிப்பாளரான திரு. ஜயமான, அவர்கள், உட்பிரவேசிப்பு ஒழுங்கு விதிகள் மற்றும் இது தொடர்பான அமைச்சரவைத் தீர்மானங்கள், மேல் நீதிமன்றக் கட்டளையின் சட்டப்பின்னணி தொடர்பாக விபரமாகவும் விளக்கினார். சபை அங்கத்தவரான திரு. சுப்பிரமணியம் அவர்கள், விழிப்புலனற்றவர்களுக்கான உட்பிரவேசிப்பு தொடர்பான தகவல்களையும் மற்றும் அங்கவீனமுற்ற நபர்களுக்கான தேசிய செயலகத்தின் தொழிற்பாடுகள் தொடர்பாகவும் சுருக்கமாக எடுத்துக் கூறினார்.

மேலும் ஆகக்குறைந்த கட்டணத்தில் அங்கவீனமுற்ற நபர்களுக்கான சாய்தளங்கள் மற்றும் மலசலகூடங்களை அமைத்தல் தொடர்பான விபரங்களும் கலந்துரையாடப்பட்டன.

உத்தியோகத்தர்களின் பங்குபற்றுதலுடன் சக்கரநாற்காலி மற்றும் வெள்ளைப் பிரம்புகளைப் பயன்படுத்துகின்ற செய்முறைத் தொடரொன்றும் நிகழ்த்தப்பட்டிருந்தமை குறிப்பிடத்தக்க அம்சமாகும்.

## දෘශ්‍යාබාධිත ඔබ වෙනුවෙන්ම සේවා සපයන දෘශ්‍යාබාධිත පුනරුත්ථාපන භාර අරමුදල

ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජන රජයේ පාර්ලිමේන්තුවේ 1992 අංක 09 දරණ පණත යටතේ පිහිටුවා ඇති දෘශ්‍යාබාධිත පුනරුත්ථාපන භාර අරමුදල මගින් දෘශ්‍යාබාධිත ඔබට පහත සඳහන් අවශ්‍යතා ඉටුකරගත හැක.



අක්ෂිකාච ලබාදීම.

අ.පො.ස.(උ.පෙළ) හදාරණ දෘශ්‍යාබාධිත දරු දැරියන්ට අධ්‍යාපන ආධාර ලබාදීම.

විශ්ව විද්‍යාල සිසුන්ට අධ්‍යාපන ආධාර ලබාදීම.

දෘශ්‍යාබාධිත දෙමාපියන්ගේ ඇස් පෙනෙන පාසල් දරුවන්ට අධ්‍යාපන ආධාර ලබාදීම.

## ශ්‍රවණාබාධිත ඔබට විශේෂ හැඳුනුම්පතක්


ශ්‍රවණාබාධිත පුද්ගලයින් ඔවුන්ගේ ශ්‍රවණාබාධිත භාවය තහවුරු කර ගැනීමට නොහැකිව මග තොටදී අප හඳුනාවයන්ට මුහුණ පෑමට සිදුවන අවස්ථා විරල නොවේ. එම තත්ත්වය මගහරවා ගැනීම සඳහා සමාජ සේවා දෙපාර්තමේන්තුව මගින් ශ්‍රවණාබාධිත පුද්ගලයන් සඳහා විශේෂ හැඳුනුම්පතක් නිකුත් කරනු ලබයි. ඒ සඳහා ඔබගේ ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සමාජ සේවා නිලධාරී / සමාජ සංවර්ධන සහකාර හමු වී ඔබගේ අවශ්‍යතාවය අදම ඉටුකර ගන්න.



## දරුවෙකුගේ වර්ධනයේ ප්‍රමාදයක් හෝ ආබාධිතබවක් හඳුනාගත් විගසම විශ්වාසයෙන් සහය පැතිය හැකි එකම රාජ්‍ය ආයතනය සමාජ සේවා දෙපාර්තමේන්තුවයි.

ඉහත අවශ්‍යතාවකදී ඔබගේ සහය සඳහා සමාජ සේවා දෙපාර්තමේන්තුව මගින් ස්ථාපිත නාවින්න, මහරගම පිහිටි ළමා මාර්ගෝපදේශන මධ්‍ය ස්ථානයට පැමිණෙන්න. විශ්වාසනීය සුහදශීලි කාර්ය මණ්ඩලයක සේවය ඔබට ලබාගත හැක.

**නාවින්න ළමා මාර්ගෝපදේශන මධ්‍ය ස්ථානයට ඇතුළත්වන ආබාධ සහිත දරුවන්ට පහත සඳහන් සේවාවන් ලබාගත හැක.**



# ජාතික වැඩිහිටි දිනය - 2012

ජාත්‍යන්තර වැඩිහිටි දිනයට සමගාමීව පවත්වනු ලබන ජාතික වැඩිහිටි දිනය පසුගිය ඔක්තෝබර් මස 01 වන දින "සුවසෙත තුළින දීර්ඝායුෂ" යන තේමාව යටතේ පැවැත්විණ. සමාජ සේවා අමාත්‍ය ගරු ෆීලික්ස් පෙරේරා මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවති මෙම උත්සවය හෙල්ප් ඒජ් ශ්‍රී ලංකා සහ හෙල්ප් ඒජ් ජාත්‍යන්තරයේ සහයෝගීත්වය ඇතිව සංවිධානය කෙරිණ.

රැස්ව සිටි පිරිස අමතමින් ගරු ෆීලික්ස් පෙරේරා මැතිතුමා ප්‍රකාශ කළේ අතිගරු ජනාධිපතිතුමාගේ මග පෙන්වීම යටතේ වැඩිහිටි ප්‍රජාවගේ දායකත්වය අගයනු වස් පහසු පරිසරයක් නිර්මාණය කිරීමටත් වැඩිහිටියන්ගේ ජීවන තත්ත්වය ප්‍රවර්ධනය කිරීමටත් සමාජ සේවා අමාත්‍යාංශය මේ වනවිටත් වැඩසටහන් රැසක් දියත් කර ඇති බවය. එහිදී රජයේ ප්‍රධාන අපේක්ෂාව වන්නේ පවුල් ඒකකය තුළ වැඩිහිටියන්ගේ සෞඛ්‍යය සුරක්ෂිත කිරීම සහ ප්‍රවර්ධනය කිරීමය. මහින්ද චින්තන ප්‍රතිපත්ති ප්‍රකාශනයෙන් දක්වා ඇති පරිදි වයස අවුරුදු 70 වැඩි වැඩිහිටියන් සඳහා ලබාදෙන රු. 1,000/- මාසික දීමනාව වැඩි කිරීම මේ යටතේ එළැඹි නවමු පියවර බවද අමාත්‍යතුමා තවදුරටත් අදහස් දක්වමින් ප්‍රකාශ කළේය.

සෑම දිස්ත්‍රික්කයකම හොඳම වැඩිහිටි කමිටුව සඳහා සම්මාන පිරිනැමීම ද මෙහිදී අමාත්‍යතුමා අතින් සිදු කෙරිණ. අනතුරුව වැඩිහිටියන්ගේ සංස්කෘතික ඉදිරිපත් කිරීම් කිහිපයකින් උත්සවය වඩාත් වර්ණවත් විය.



## ප්‍රාදේශිය මට්ටමින් සමාජ සත්කාරක සංකල්පය ව්‍යාප්ත කිරීමේ තවත් පියවරක්

කළුතර දිස්ත්‍රික්කයේ බණ්ඩාරගම, මදුරාවල සහ මිල්ලනිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්ට අනුයුක්ත ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා සමාජ සත්කාරක සංකල්පය පිළිබඳ දෙදින නේවාසික වැඩමුළුවක් අගෝස්තු මස 13 සහ 14 දිනයන්හි දී පැවැත්විණ.

## ශ්‍රව්‍යාබාධිත ඔබගේ අවශ්‍යතාවයට අපෙන් විසඳුම්

ශ්‍රව්‍යාබාධිත ඔබට සමාන්‍ය ජීවිතයේදි ඔබගේ අවශ්‍යතා ඉටුකර ගැනීමේදි බලපාන ප්‍රධානම ගැටළුව සන්නිවේදන බාධාය. ඔබගේ එම ගැටළුව අවම කිරීමට රාජ්‍ය ආයතනයක් ලෙස සමාජ සේවා දෙපාර්තමේන්තුව මැදිහත්කරුවෙකු ලෙස කටයුතු කරයි.

**සංඥා භාෂා පරිවර්තක සේවය සමාජ සේවා දෙපාර්මේන්තුව මගින් පහත සදහන් අවස්ථා වලදී ඔබට ලබාගත හැක.**

උසාවි කටයුතුවලදී ශ්‍රව්‍යාබාධිත ඔබ වෙනුවෙන් පරිවර්තන කටයුතු කිරීම.

පොලිසියකදී ශ්‍රව්‍යාබාධිත ඔබ වෙනුවෙන් පරිවර්තක කටයුතු කිරීම.

රාජ්‍ය නොවන සංවිධාන හා පෞද්ගලික අංශයේ අවශ්‍යතාවයන් සඳහා සේවා සැපයීම.

## ආබාධ සහිත තැනැත්තන් සඳහා රැකියා පොළ

ආබාධ සහිත තැනැත්තන්ගේ ජාත්‍යාන්තර දිනය දෙසැම්බර් 03 වැනි දිනට යෙදුන අතර, එයට සමගාමීව ආබාධ සහිත තැනැත්තන් සඳහා රැකියා පොළක් සමාජ සේවා අමාත්‍යාංශය, කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශය, ජාත්‍යන්තර කම්කරු සංවිධානය සහ ලංකා සේව්‍ය සම්මේලනය සමග ඒකාබද්ධව දෙසැම්බර් 13 වන දින දවස පුරා කොළඹ ශ්‍රී ලංකා පදනම් ආයතනයේදී ඉතා සාර්ථක ලෙස පවත්වන ලදී.ආබාධ සහිත තැනැත්තන්ගේ රැකියා පොළ සඳහා කොළඹ, කළුතර, ගම්පහ දිස්ත්‍රික් නියෝජනය කරමින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් රැකියා අපේක්ෂිතයන් විශාල ප්‍රමාණයක් සම්මුඛ පරීක්ෂණ සඳහා ඉදිරිපත් විය. මේ අයට රැකියා ලබා දීම සඳහා පෞද්ගලික ආයතන 30 ක් එම අවස්ථාවට සම්බන්ධ වී සිටි අතර, සුදුසුකම් සපුරා ඇති විශාල පිරිසකට රැකියා අවස්ථා උදාකර දීමට එම ආයතන විසින් කැමැත්ත පල කරන ලදී.

# විශේෂ අවශ්‍යතා සහිත දූදරුවන් වෙනුවෙන් වෘත්තිය මෙවලම්...

ආබාධ සහිත පුද්ගලයන් පුනරුත්ථාපනය රජයේ වගකීමක් ලෙස සලකනු ලබන අතර ඒ අනුව සමාජයේ ස්ථානගත වීමේ විෂමතාව සම්බන්ධයෙන් ආබාධ සහිත පුද්ගලයන් ඔවුන්ගේ හැකියා අනුව පුහුණු කර පුනරුත්ථාපනය සඳහා වෘත්තීය පුහුණු වැඩසටහන් සමාජ සේවා දෙපාර්තමේන්තුව මගින් පවත්වාගෙන යමින් සිටියි.



මේ යටතේ සීදූව, කැටවල, වත්තේගම යන ස්ථානවල පවත්වාගෙන යනු ලබන ආබාධ සහිත වූවන් සඳහා වූ වෘත්තිය පුහුණු ආයතනවල පුහුණුව සාර්ථකව නිම කල අභ්‍යාසලාභීන් 80 දෙනෙකුට මෙවලම් කට්ටල ලබාදීමේ උත්සවය ජාඇල ආසිරි එන්වයරන්මන්ට් ආයතනයේදී මාර්තු මස 13 දින පැවැත්විණි.

මෙහිදී බෙදා දෙනු ලැබූ මෙවලම් කට්ටල වල වටිනාකම රු. 1,500,000 පමණ වෙයි.






# දැයට කිරුළ ජාතික වැඩසටහනට ජාතික සමාජ සංවර්ධන ආයතනයේ මැදිහත් වීම.

ජාතික සමාජ සංවර්ධන ආයතනය මගින් දැයට කිරුළ 2013 ජාතික සංවර්ධන වැඩසටහනට අදාලව අම්පාර, පොළොන්නරුව, මඩකලපුව හා ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයන් වැඩසට හන් ක්‍රියාත්මක කරන ලදි.

සමාජ සංවර්ධන ප්‍රතිපත්ති, පර්යේෂණ හා ප්‍රකාශන අංශය මගින් ඉහත සඳහන් දිස්ත්‍රික්වල තෝරාගත් දුෂ්කර ගම්මාන 04ක එනම් අම්පාර දිස්ත්‍රික්කයේ – දීඝවාපිය, පොළෙ ාන්නරුව දිස්ත්‍රික්කයේ – සිංහගම, මඩකලපුව දිස්ත්‍රික්කයේ – මහවැලි ආරු (මරප්පාලම්) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ – නවුඋර්තු ගම්මානවල ජනතාවට සැපයෙන සේවා සැපයුම් පද්ධතියේ බලපෑම් අධ්‍යයනය කර ඇති අතර පර්යේෂණ වාර්තාවක් සිංහල, දමිළ මාධ්‍යවලින් සැකසේ. ඒ තුළින් එම ප්‍රදේශවල ජනතාව තම සේවාවන් ලබාගැනීමේදී මුහුණු දෙන ගැටළු හා අභියෝග හඳුනා ගෙන ඒවාට විසඳුම් යෝජනා කිරීමටත් ඒවා දේශපාලන අධිකාරියේ, ප්‍රතිපත්ති සම්පාදකයින්ගේ හා පරිපාලකයින්ගේ අවධානයට යොමු කිරීමටද අපේක්ෂා කරමු.

පුහුණු අංශය මගින් දිස්ත්‍රික්ක හතර තුල සේවය කරන සිංහල දමිළ රජයේ ක්ෂේත්‍ර නිලධාරීන් 100ක් සඳහා ප්‍රජා සංවර්ධන හා රාජ්‍ය නිලධාරීන්ගේ වගකීම් යන මැයෙන් දින 01 වැඩමුළු 04ක් ජනවාරි මස 21,22,23,24 දින දිනයන්හි ක්‍රියාත්මක කරන ලදි. මෙහිදී ක්ෂේත්‍ර කටයුතුවල යෙදී සිටින රාජ්‍ය නිලධාරීන්ට තම ඉලක්ක, ප්‍රජාව සංවර්ධනය කිරීමට තිබෙන්නා වූ යුතුකම් හා වගකීම් අවධාරණය කරන ලදි.

# ආබාධ සහිත තැනැත්තන් සඳහා විශේෂිත නිවාස වැඩසටහනක්

ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාත්‍යන්තර දිනයට සමගාමීව ශ්‍රී ලංකාවේ ආබාධ සහිත තැනැත්තන් සඳහා නිවාස 100 ක් තැනීමේ කඩිනම් වැඩසටහනක් නොබෝදා ආරම්භ කරන ලදී. මෙම වැඩසටහනේ මුල් අදියර යටතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ සියලු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ ආවරණය වන සේ නිවාසලාභීන් 100කු තෝරාගෙන ඇති අතර



මුල්ගල් තැබීමේ උත්සවය කුරුණෑගල දිස්ත්‍රික්කයේ මාස්පොත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කුඩල්ගමුවේ දී පවත්වන ලදී. නිවාසලාභීන් 80 දෙනකුට රු. 250,000/= බැගින්ද ඉතිරි නිවාසලාභීන්ට රු. 150,000/= බැගින්ද මෙහිදී නිවාස තැනීමේ ආධාර මුදල් වශයෙන් පිරිනමන ලදී.

## කියවීමට හුරුවන ළමුන්...

සමාජ සංවර්ධන වැඩසට හනක් ලෙස දුෂ්කර ප්‍රදේශවල ළමුන් උනන්දුවෙන් කියවීමට හුරුකිරීමට සඳහා කියවීමේ වැඩසටහන් 05ක් අම්පාර, පොළොන්නරුව, ත්‍රිකුණාමලය හා මඩකලපුව දිස්ත්‍රික්කයන්හි තෝරාගත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල මෙම වැඩසට හන් ආරම්භ කොට ඇත.

## யாழ்ப்பாணத்திலும் சமூக சேவைகள் அமைச்சின் நடமாடும் சேவைகள்

சமூக சேவைகள் கௌரவ அமைச்சர் பீலிக்ஸ் பெரேரா, சமூக சேவைகள் அமைச்சின் செயலாளர் திரு. ஆர்.எம்.எஸ். ரத்னாயக், கட்டளைப் பாதுகாப்புப் படைகள் - யாழ்ப்பாணம் (எஸ்எவ்-ஜெ) படைத்துறைப் பணித் தலைவர் மஹிந்த ஹதுறுசிங்க, யாழ் அரச அதிபர் திரு. எஸ். அருமைநாயகம் மற்றும் இராணுவத்தின் சிரேஷ்ட உத்தியோகத்தர்கள் மற்றும் சிவில் நிருவாக சேவைகள், யாழ்ப்பாணத்திலுள்ள பல பிரதேச செயலகங்களில் 2012, யூன் 08 ஆந் திகதியன்று பல நிகழ்வுகளில் பங்குபற்றியுள்ளனர். அதன் பின், அமைச்சரும் மற்றும் ஏனையவர்களும் யாழ் வீரசிங்கம் மண்டபத்திற்கு விஜயம் செய்து 100 அங்கவீனமுற்ற மக்களுக்கு 50 சக்கரநாற்காலிகளும் மற்றும் 50 கையூன்றுகோல்களும் நன்கொடையளித்துள்ளனர். இப்பயனாளிகள் பிரதேச செயலாளர்களின் ஒத்துழைப்புடன் யாழ்ப்பாணப் பாதுகாப்பு படைகளின் 51 பிரிவினால் தெரிவு செய்யப்பட்டுள்ளனர்.

இந் நிகழ்வில், சிரேஷ்ட பிரஜைகளுக்கான நிகழ்ச்சித் திட்டத்தின் கீழ் 70 வயதிற்கு மேற்பட்ட 200 முதியோர்கள் தேசிய சேமிப்பு வங்கியின் முகாமைத்துவத்தின் கீழ் தபால் அலுவலகங்களினூடாக ரூபா 1000/- ஐ வைப்பிலிடப்பட்ட வங்கியிருப்புக் கையேட்டினைப் பெற்றுக் கொண்டுள்ளனர். நாடுபூராகவுமுள்ள அங்கவீனமுற்ற நபர்களுக்கான வீடமைப்புச் செயற்திட்டத்தின் கீழ் 59 அங்கவீனமுற்ற நபர்கள், சமூக சேவைகள் அமைச்சிடமிருந்து வீடுகளினை நிர்மாணிப்பதற்கான மானியங்களைப் பெற்றுக்கொண்டுள்ளனர்..

# දැයට කිරුළින් ආබාධ සහිත පුද්ගලයින්ට ප්‍රතිලාභ රාශියක්...

ආබාධ සහිත පුද්ගලයින් සඳහා වූ ජාතික මහ ලේකම් කාර්යාලය මගින් දැයට කිරුළ වැඩසටහන යටතේ අම්පාර දිස්ත්‍රික්කයේ ආබාධ සහිත පුද්ගලයින් වෙත ප්‍රතිලාභ රාශියක් ලබාදීමට පියවර ගෙන ඇත.

මෙමගින් ආබාධ සහිත පුද්ගලයින් සඳ හා කඩිනම් නිවාස ආධාර වැඩසටහන යටතේ පුද්ගලයින් 71 දෙනෙකු සඳහා රු.7,841,000/- ලබාදී ඇත.

අම්පාර පොළොන්නරුව දිස්ත්‍රික්යන්හි සියලුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ ආවරණය වන පරිදි ජංගම සේවා වැඩසටහන් 12ක් පමණ පවත්වා ඇස්කන්නාඩි, රෝද පුටු, අත්වාරු හා කිහිලිකරු බෙදා දෙන ලදී. පුද්ගලයින් 10,050ක් ප්‍රතිලාභ ලබා ඇත.



## සමාජ වැඩ උපාධි ප්‍රධානෝත්සවය - 2012

2012 වර්ෂය සඳහා සමාජ වැඩ උපාධිය හදාරා අවසන් කළ උපාධිධාරීන්ගේ උපාධි ප්‍රධානෝත්සවය 2012 ජූනි මස 11 වන දින බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවේදී පැවැත්විණ. සමාජ සේවා අමාත්‍ය ගරු ෆීලික්ස් පෙරේරා මැතිතුමා සහ සමාජ සේවා නියෝජ්‍ය අමාත්‍ය ගරු චන්ද්‍රසිරි සූරියආරච්චි මැතිතුමා මෙන්ම අමාත්‍යාංශ ලේකම් ඇතුළු ජ්‍යෙෂ්ඨ නිලධාරීන් ද මෙම අවස්ථාවට සහභාගී වූහ.

## ඩිප්ලෝමා සහතික පත්‍ර ප්‍රදානය කිරීමේ උත්සවය



සමාජ සේවා අමාත්‍යාංශය යටතේ පවතින ආයතනයක් වන ජාතික සමාජ සංවර්ධන ආයතනයේ සමාජ වැඩ ඩිප්ලෝමා පාඨමාලාව සහ උපදේශන ඩිප්ලෝමා පාඨමාලාව සාර්ථකව නිම කළ සිසුන් සඳහා එහිදි ඩිප්ලෝමා සහතික පත්‍ර ප්‍රදානය කෙරිණ. ආසියා පදනමෙහි වැඩසටහන් අධ්‍යක්ෂ ආචාර්ය මේරියන් ස්ටොන්ටන් විසින් ප්‍රධාන දේශනය පවත්වන ලදී.

## ආබාධ සහිත පුද්ගලයින් සඳහා වන ප්‍රජා මූලික පුනරුත්ථාපන ජාතික වැඩ සටහන (CBR)

**2012 CBR වැඩ සටහන දිස්ත්‍රික්ක 25 හි ප්‍රාදේශීය ලේකම් කාර්යාල 332 සිට ක්‍රියාත්මක කරන ලද අතර, ආබාධ සහිත පුද්ගලයින් බලගැන්වීම සඳහා වැඩි අවධානයක් යොමු කරන ලදි.**

### 2012 වසරේ ක්‍රියාත්මක වැඩ සටහන්

සියලුම දිස්ත්‍රික් කමිටු පැවැත්වීම හා ශ්‍රී ලංකාවේ ආබාධිත බව පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය මග පෙන්වීම ලබා දීම.
සියලුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල ආබාධ සහිත පුද්ගලයින්ගෙන් සැදූම්ලත් ස්වශක්ති සංවිධාන හා දෙමව්පිය සංවිධාන පිහිටුවීම.
දිස්ත්‍රික්ක 19 ක ස්වශක්ති දිස්ත්‍රික් සංවිධාන පිහිටුවීම හා බලගැන්වීම.
ඌව පළාතේ පළාත් කමිටුව පිහිටුවීම හා ආබාධ සහිත පුද්ගලයින් බලගැන්වීමේ වැඩමුළුව.
ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වල සිටින නුපුහුණු නිලධාරීන් සඳහා මූලික පුහුණු වැඩමුලු හා ස්වේච්ඡා සේවක පුහුණු වැඩමුළු පැවැත්වීම.
ආබාධ සහිත පුද්ගලයින් සඳහා ප්‍රවේශ පහසුකම්, කොමඩ් සහිත වැසිකිලි හා වෙනත් අවශ්‍යතාවයන් සැපයීම.
ප්‍රවේශ පහසුකම් නියෝග පිළිබඳව මැදිහත්වීම.
ආබාධ සහිත පුද්ගලයින්ගේ පවුල්වලට ජීවනෝපාය වැඩ සටහන් හඳුන්වා දීම.
ආබාධ සහිත ළමුන් පාසල්ගත කිරීම හා වෘත්තීය පුහුණු සඳහා යොමු කිරීම.
හඳුනාගත් ආබාධ සහිත පුද්ගලයින් CBR ජාතික අත්පොතට අනුව ඔවුන්ගේ එදිනෙදා ක්‍රියාකාරකම් කර ගැනීම සඳහා පුරුදු පුහුණු කිරීම හා වැඩිදියුණු කිරීම.
ක්ෂේත්‍ර නිලධාරීන් හා ප්‍රජා නායකයින් සඳහා වැඩමුළු පැවැත්වීම.
ආබාධ සහිත පුද්ගලයන්ට රැකියා ලබාදීම සඳහා රැකියා වෙළඳපොලවල් කළුතර හා අත්තනගල්ල ප්‍රදේශයේදී පැවැත්වීම.

## தனியொருவரைத் தலைவராகக் கொண்ட குடும்பங்களைப் புனர்வாழ்வளிக்கும் நிகழ்ச்சித் திட்டம்.

சமூக சேவைகள் அமைச்சின் தனியொருவரைத் தலைவராகக் கொண்ட குடும்பங்களைப் புனர்வாழ்வளிக்கும் செயற்திட்டத்தினூடாக அம்பாறை மாவட்டத்தில் 03 குடும்பங்களும், மட்டக்களப்பு மாவட்டத்தில் 05 குடும்பங்களும், யாழ்ப்பாண மாவட்டத்தில் 05 குடும்பங்களும் மற்றும் கிளிநொச்சி மாவட்டத்தில் 17 குடும்பங்களும் சுயதொழிலுக்காக தலா ரூபா. 10.000/- உதவியைப் பெற்று சுயதொழிலை வெற்றிகரமாக நடாத்திக் கொண்டிருக்கின்றனர். அத்தோடு எதிர்வரும் மாதம் நடைபெறவுள்ள தேசத்திற்கு மகுடம் நிகழ்விலும் மேலும் பலர் இவ்வுதவியைப் பெறவுள்ளனர்.

# හිතට සවිය දැයට කිරුළ

සමබර පෞරුෂයකින් යුත් නිරෝගීමත් ජාතියක් යන දැක්ම යටතේ ජාතික උපදේශන මධ්‍ය ස්ථානය විසින් ශ්‍රී ලංකාවේ ජනතාවගේ මානසික සෞඛ්‍ය ඉහළ නැංවීමේ මහගු කාර්යක නියැලෙමින් සිටියි. 2013 දැයට කිරුළ වැඩසට හන නිමිති කොට ගෙනද උපදේශන වැඩසටහන් ක්‍රියාත්මක කොට ඇත.

සියදිවිනසාගැනීම වැළැක්වීම් අවම කිරීමේ හා චිත්ත පීඩා කළමනාකරණ එක් දින මනෝවිද්‍යාත්මක උපදේශන වැඩසටහන් හා සායන අම්පාර, තිරුක්කෝවිල්, නින්දවූර්, සම්මන්තුරෙයි, මූතූර්, කින්නියා, කාන්තන්කුඩි, මන්මුනෙයි උතුර , ඇළ හැර, තමන්කඩුව යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වල පවත්වන ලද අතර පුද්ගලයින් 9499 දෙනෙකු ප්‍රතිලාභ ලබා ඇත.

ළමා සමාජ නායකයින් උපදේශනය පිළිබඳ දැනුවත් කිරීමේ තෙදින උපදේශන වැඩසටහන හා ළමා පෞරුෂ සංවර්ධන වැඩසටහන් අම්පාර දිස්ත්‍රික්කයේ තෝරාගත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වල පවත් වන ලදී.

එමෙන්ම හඳුනාගත් මනෝ සමාජයීය ගැටළු නිරාකරණය, අවදානම් තත්වයන්ට ගොදුරු විය හැකි දරුවන්ගේ පෞරුෂ සංවර්ධනය, සාර්ථක ජීවිතයක් සඳහා වන දැනුවත් කිරීමේ පිළිබඳ උපදේශන වැඩසටහන් අම්පාර හා පොලොන්නරුව දිස්තික්කවල තෝරාගත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වල පවත්වා ඇත. මුළු ප්‍රතිලාභීන් ගණන 1470 කි.

## 2013 දැයට කිරුළ ප්‍රදර්ශනයට සමගාමීව සමාජ සේවා දෙපාර්තමේන්තුව මගින් පවත්වන ලද වැඩසටහන් ...

2013 අම්පාර දිස්ත්‍රික්කයේ පැවැත්වීමට නියමිත දැයට කිරුළ සංවර්ධන ප්‍රදර්ශනයට සමගාමීව සමාජ සේවා දෙපාර්තමේන්තුව මගින් මත්ද්‍රව්‍ය ගැටලුව පිළිබඳව පොළොන්නරුව, මඩකලපුව, අම්පාර, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්ක වල පාසල් සිසුන් හා ප්‍රජා නියාමකයින් දැනුවත් කිරීම සඳහා සියලුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල ආවාරණය වන ආකාරයෙන් වැඩසටහන් පැවැත්වීම සඳහා සමාජ සේවා දෙපාර්තමේන්තුව මගින් මූල්‍ය ප්‍රතිපාදන නිදහස් කරන ලද අතර මේ යටතේ පාසල් හා ප්‍රජා නියාමකයන් දහසක් පමණ දැනුවත් කර ඇති අතර මේ සඳහා රුපියල් ලක්ෂයක පමණ මුදල් ප්‍රතිපාදන වැය කර ඇත.

මෙම දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම තුළින් සමාජ සේවා දෙපාර්තමේන්තුව මගින් අපේක්ෂා කරනුයේ දැනුවත් වූ පාසල් සිසුන් හා ප්‍රජා නියාමකයන් සමාජ වැඩකරුවන් වශයෙන් යොදා ගෙන ඉදිරියේදී මෙම ප්‍රදේශ මත් ගැටලුව පිළිබඳ අවධානමින් ගලවා ගැනීමයි. විශේෂයෙන් මෙම ප්‍රදේශ වල කෘෂි කාර්මික ජීවන රටාවට හුරු වූ ජනතාවගේ දුම් බිම, බුලත්විට සැපීම වැනි පුරුදු සඳහාද මොවුන් දෛනිකව උපයන මුදලින් යම් සැළකිය යුතු මුදලක් වැය කරන හෙයින් මෙම දැනුවත් කිරීමේ වැඩසටහන් වලදී එම පුරුදු මත්ද්‍රව්‍ය උවදුර සඳහා ඇති දොරටු වශයෙන් පිටු දැකීමට ලක් වූ

හෙයින් මෙම වැඩසටහන් තුළින් ඉතා වැදගත් අරමුණු රැසක් ඉදිරියේදී ඉටුවේයයි විශ්වාස කෙරේ.

මතට තිත මහින්ද චින්තන ප්‍රතිපත්ති ප්‍රකාශනයේ ඇතුලත් නියමයන්ට අනුව රට සමගාමීව පවත්වන ලද මෙම වැඩසටහන් වල අවසාන ඉලක්කය මෙම ප්‍රදේශ වල ජනතාව මතින් තොර ආර්ථික වශයෙන් ශක්තිමත් වූ පිරිසක් බවට පත්කිරීමයි.

### අපගේ මෙහෙවර

සමාජ සුභසාධන හා සමාජ සංවර්ධන ප්‍රතිපත්ති මෙහෙයුම් හා නායකත්වය මගින් සමාජයේ අවාසි සහගත තත්වයන්හි සිටින අයට හිතකාමී පරිසරයක් හා අවස්ථා උදාකර දීමෙන් ඒ අයද ජාතික සංවර්ධනයේ කොටස්කරුවන් කිරීම.

සමාජ සේවා අමාත්‍යාංශය
1වන මහල,
සෙත්සිරිපාය (දෙවන අදියර),
බත්තරමුල්ල.
දු.ක. 0113069821(තාවකාලික)
msssec@sltnet.lk
www.socialwelfare.gov.lk

**උපදෙස් හා මග පෙන්වීම**

ඉමෙල්ඩා සුකුමාර් - ලේකම්

එන්. කේ අබේරත්න -අතිරේක ලේකම්(පාලන)

එම්.සී.එල්. ප්‍රනාන්දු -අතිරේක ලේකම්(සංවර්ධන)

**අධීක්ෂණය**

එම්.රාමමූර්ති - අධ්‍යක්ෂ(සැලසුම්)

**සංස්කරණය**

ලනිකා ජයකොඩි -සහකාර අධ්‍යක්ෂ (සැලසුම්)

**සංස්කරණ සම්බන්ධීකරණය හා පරිගණක පිටු සැකසුම**

කීර්ති මහානාම - තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී

**සංස්කරණ සහාය**

ජසින්තා ෂන්මුගනාදන් - කළමණාකරණ සහකාර